# ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල්වල ක්‍රියාත්මක වන විෂය සමගාමී කටයුතු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් ( මාතර දිස්ත්‍රික්කය ඇසුරින්)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති
පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණ නිබන්ධනය.

STOCK VERIFICATION
11 OCT 2013

91/ එම්.ෆිල්/ 07

UCLIB
471323
Class No.
Acc. No.

යාමසිරි බැද්දේගම
බී. ඒ.. අධ්‍යාපන ඩිප්ලෝමා( විශිෂ්ට)

# සංක්ෂේපයෙන්

ද්විතීයික පාසල් අධ්‍යාපනය සිසුන්ගේ පෞද්ගලික සංවර්ධනය මෙන් ම රටේ සංවර්ධනයට හේතු වේ යයි අපේක්ෂා කෙරේ. බුද්ධිමය, කායික, චිත්තවේගීය හා සමාජයීය අංශවලින් ශිෂ්‍යයාතුළ විය යුතු සංවර්ධනය ඉටු කිරීම පැවරී ඇත්තේ පාසල වෙතටය. පාසල තම කාර්ය කරනු ලබන්නේ විෂයමාලාව ක්‍රියාත්මක කිරීමෙනි. විෂයමාලාවට ඇතුලත්වන විෂය සමගාමී කටයුතු, ද්විතීයික පාසලේ ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ විෂය ක්ෂෙත්‍රය වේ. නූතන අධ්‍යාපන ප්‍රවණතාවයක් වන විභාග කේන්ද්‍රීය බව හා ශාස්ත්‍රීය අධ්‍යාපනයට නැඹුරු බව සාකච්ඡා කිරිමෙන් අනතුරුව, විෂයමාලාව හා විෂය සමගාමී කටයුතු පිළිබඳ නිර්වචනයක් ගොඩනගාගැනීමටත්, දිවිතීයික පාසල් සිසුන්ගේ මනෝවිද්‍යාත්මක පසුබිම හා, ද්විතීයික අධ්‍යාපනයේ අරමුණු හඳුනාගැනිමටත් පළමු පරිච්ඡේදයෙන් උත්සහා කර ඇත.

දෙවැනි පරිච්ඡේදයෙන් විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සාහිත්‍ය විමර්ෂණය ක්ෂෙත්‍ර 05 ක් යටතේ විස්තර කර ඇත. ඒවා නම්, පුද්ගල - සමාජ ගති ලක්ෂණ, ශාස්ත්‍රීය සාධනය කෙරේ බලපෑම, අධ්‍යාපන අපේක්ෂා සහ ප්‍රාප්තිය ක්‍රියාකාරකම්වල යෙදීමේ මට්ටම හා පරිසරමය සහ සමාජමය සම්බන්ධතා යන අංශ වේ. ඊට අමතරව 20 වන සියවසේ ආරම්භයේ සිටම අධ්‍යාපන ප්‍රතිපත්තිවල විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව දක්වා ඇති අවධානය සාකච්ඡාකර ඇත. අනතුරුව කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා (1943) වල සිට පාසල් සංවර්ධන. මණ්ඩල පනත (1992) දක්වා මෙරටේ වරින්වර හඳුන්වා දෙනු ලැබූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවල විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ දක්වා ඇති අදහස් සාකච්ඡා කිරිමෙන් මෙම පරිච්ඡේදය නිමවෙයි.

මෙහි තුන්වන පරිච්ඡේදයෙන් පර්යේෂණය ආරම්භ කරමින්, ගැටළුව යටතේ අධ්‍යාපන පරමාර්ථ මෙන්ම ශාස්ත්‍රීය අධ්‍යාපනයේ අරමුණු ඉටුකර ගැනීමට විෂය සමගාමි ක්‍රියාකාරකම් වල අදාළ බව සාකච්ඡා කර ඇත. පර්යේෂණ සීමා, විෂය සමගාමී ක්‍රියාකාරකම් වර්ගීකිරීම, අධ්‍යයනයේ අරමුණු සහ දත්ත රැස්කිරීම පිළිබඳ අදාළ තොරතුරු ඉදිරිපත් කෙරේ. මාතර දිස්ත්‍රික්කයේ පාසල් 28 කින් විදුහල්පතිවරුන්, ගුරුවරුන්, සිසුන් හා දෙමාපියන් 364 ක තියැදියක් යොදාගෙන ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස්කර ගන්නා ලදී.

රැස්කරගත් දත්ත සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම භාවිත කරමින් විශ්ලේෂණය කිරීම පස්වන පරිච්ඡේදයේදී කර ඇත. විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ අරමුණු පද්ධතියක් සැකසීම, ආකල්ප මැනිම, ශිෂ්‍ය සාධන පැතිකඩක් සැකසීම හා සංවිධාන ව්‍යුහය පිළිබඳ අදාළ දත්ත, සටහන් හා වගු උපයෝගිකරගෙන විශ්ලේෂණය කරන්නට යෙදිණි.

අවසාන වශයෙන් ලබාගත් දත්ත පිළිබඳ අර්ථ කථනය කිරීමෙන් පසුව එම තොරතුරු පදනම් කරගෙන නිගමන ඉදිරිපත් කිරීමත්, විධිමත් විෂය සමගාමී ක්‍රියාකාරකම් පද්ධතියක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමත්, පස්වන පරිච්ඡේදයේදී සිදුකර ඇත.